**ශීර්ෂය 290 ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව**

**--------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුලි 26 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජුලි 29 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| 2019 වර්ෂයේ 154 (6) විගණකාධිපති වාර්තාවට ජේද යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
|---|---|---|
| (i) 1.6.2 (අ) (මූල්‍ය තත්ත්ව ප්‍රකාශය) | 2019 දෙසැම්බර් 31 දිනට දේපල පිරියත හා උපකරණවල මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.742,365,856 ක් වුවද භාණ්ඩාගාර පොත් අනුව වත්කම් වාර්තාවේ එම වටිනාකම රු.620,871,012 ක් වූයෙන් රු.121,494,844 ක නොසැසඳීමක් නිරූපණය විය. | වෙනසට හේතු හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ii) 1.6.3 (අ) (ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම) | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන අනුව හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගත යුතු වේ. |
| (iii ) 1.6.4 (අ) (විගණන සාක්ෂි නොවීම) | 2019 වර්ෂයේ මුහුදු කුඩැල්ලන් අපනයන බලපත්‍ර ආදායම වශයෙන් මුදල් අංශයේ ලැබීම්වල මුළු එකතුව රු.4,595,850 ක් ලෙස සඳහන් වුවද කළමනාකරණ අංශය මඟින් නිකුත් කර තිබූ බලපත්‍රවල වටිනාකම රු.4,365,850 ක් වූ බැවින් රු.230,000 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර ඒ සඳහා සාක්ෂි ඉදිරිපත් නොවිය. | නිවැරදිව ආදායම් වාර්තා පවත්වාගෙන යා යුතු වේ. |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**ආදායම් නොවන ලැබීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) භාණ්ඩාගාර අග්‍රිම වශයෙන් රු.730,183,000 ක් ලැබී තිබුණ ද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එය රු.743,989,899 ක් ලෙස දක්වා තිබුණු හෙයින් රු.13,806,899ක් භාණ්ඩාගාර අග්‍රිම වැඩියෙන් දක්වා තිබුණි. | වෙනත් දෙපාර්තමේන්තු වෙනුවෙන් එකතු කළ ආදායම් ද භාණ්ඩාගාර අග්‍රිම ලැබීම්වලට එකතු කර ඇති බව. | භාණ්ඩාගාර අග්‍රිම නිවැරදිව ගිණුම් ගත කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා දෙපාර්තමේන්තුවේ ශේෂ පිරික්සුම අනුව මූලධන වත්කම් අත්පත් කර ගැනීම් රු.17,152,913 ක් වුවද භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය (**SA**-82) අනුව එම වටිනාකම රු.16,078,663 ක් ලෙස දක්වා තිබුණු හෙයින් රු.1,074,250ක වෙනසක් විය. | අස්පෘශ්‍ය වත්කම් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතවල ඇතුලත් නොවීම නිසා මෙම වෙනස ඇතිවී තිබෙන බව. | දෙපාර්තමේන්තුවේ පොත් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතය හා සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |

**1.6.2** **මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

**-------------------------**

**දේපල පිරියත හා උපකරණ**

**--------------------------------**

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට දේපල පිරියත හා උපකරණවල මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.778,299,720 ක් වුවද භාණ්ඩාගාර පොත් අනුව වත්කම් වාර්තාවේ එම වටිනාකම රු.777,186,965 ක් වූයෙන් රු.1,112,755 ක නොසැසඳීමක් නිරූපණය විය. | ඉදිරියේ දී මෙවැනි අඩුපාඩු මඟහරවා ගැනීමට කටයුතු කරන බව. | මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතු වේ. |
| (ආ) | 2020 වර්ෂයේ මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශයේ 2019 වර්ෂයට අදාල දේපල පිරියත හා උපකරණවල ශේෂය රු.759,723,389 ක් ලෙස දක්වා තිබුණ ද සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩාගාර වාර්තාවේ (SA82) හා ACA-6 වාර්තාවේ පිළිවෙලින් එම වටිනාකම් රු. 761,108,302ක් හා රු.671,412,631 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.1,384,913 ක හා රු.88,310,758 ක වෙනසක් නිරීක්ෂණය විය. | අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. | -එම- |
| (ඇ) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුමට අනුව මූලධන වත්කම් අත්පත් කරගැනීම් ලෙස රු.17,152,913 ක් පෙන්වා තිබුණ ද **ACA-6** ජංගම නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ මූලධන වත්කම් මිලදී ගැනීම් එකතුව රු.17,264,578 ක් ලෙස රු.111,665ක් වැඩියෙන් දක්වා තිබුණි. | පරීක්ෂා කර බලා ස්ථාවර වත්කම් ලේඛණය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ස්ථාවර වත්කම් ලේඛණය නිවැරදි කර **ACA-6** ජංගම නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ යුතු වේ. |

**1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් රු.8.337,904 ක් ලෙස දක්වා තිබුණ ද දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුමට අනුව එම වැය එකතුව රු.22,024,315 ක් විය. මේ අනුව රු.13,686,411 ක් අඩුවෙන් මුදල් ප්‍රවාහයේ දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සඳහන් කර ඇති රු. 8,337,904.00 මුදල වෙනත් අමාත්‍යාංශ වෙනුවෙන් දරන ලද පුනරාවර්තන වියදම් වල එකතුව පමණක් බව. | මුදල් ප්‍රවාහ ප්රකාශය නිවැරදිව පිළියෙල කළ යුතු වේ. |
| (ආ) | දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුම අනුව භෞතික වත්කම් අත්පත් කර ගැනීම් රු.66,878,818ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ භෞතික වත්කම් අත්පත් කර ගැනීම් යටතේ වටිනාකම රු.65,825,103 ක් ලෙස දක්වා තිබුණි. මේ නිසා රු.1,053,715 ක වෙනසක් නිරීක්ෂණය විය. | එම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ භෞතික වත්කම් අත්පත් කර ගැනීම යටතේ රු. 1,053,715 ක වෙනසක් ලෙස දැක්වෙන්නේ මූලධන වියදම්වල හරස් සටහන්ය. එම හරස් සටහන් අඩුකර මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සඳහන් කර ඇති බව. | -එම- |
| (ඇ) | දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුමෙහි සඳහන් තැන්පතු ලැබීම් වටිනාකම රු.41,355,220ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ තැන්පතු ලැබීම් රු.38,529,938ක් ලෙස දක්වා තිබීමෙන් තැන්පතු ලැබීම් වටිනාකම රු.2,825,282ක් අඩුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. | තැන්පතු ලැබීම්වල හරස් සටහන් වටිනාකම රු. 2825.282 ක් අඩුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් කිරීම නිසා මෙම වෙනස ඇතිවී තිබෙන බව. | -එම- |
| (ඇ) | දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුම අනුව තැන්පතු ගෙවීම් වටිනාකම රු.35,244,629ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එම අගය රු.32,419,346ක් ලෙස දක්වා තිබීමෙන් තැන්පතු ගෙවීම් රු.2,825,282ක් අඩුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ තැන්පතු ගෙවීම සටහන් වන්නේ මුදල් අගය පමණි. එහෙත් ශේෂ පිරික්සුමේ හරස් සටහන් වල අගයද එකතු වී තිබීම නිසා මෙසේ වෙනසක් ඇතිවී ඇති බව. | -එම- |

**1.6.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

මේ සම්බන්ධයෙන් අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර පොත් (**SA**–52) අනුව අත්තිකාරම් ලැබීම් වටිනාකම රු.22,264,578 ක් වුවද දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුම අනුව රු.21,896,294 ක් විය. ඒ අනුව රු.368,284 ක් වූ වෙනස ගැලපුම් ගිණුමට ගලපා නොතිබුණි. | දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුමෙහි දෙපාර්තමේන්තුව විසින් මුදලින් හා හර සටහන් වලින් එකතු වූ ලැබීම් ඇතුලත්ව ඇති බවත් ගිණුම් සාරාංශ මගින් සිදු කරන ලද ගනුදෙනු එහි ඇතුලත්ව නැති බව. | දෙපාර්තමේන්තු හා භාණ්ඩාගාර පොත් අතර වෙනස හඳුනාගෙන අක්මුදල් ගැලපුම් ගිණුමට ගැලපිය යුතු වේ. |
| (ආ) | රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම සඳහා වූ වාර්ෂික සැසඳුම් ප්‍රකාශයේ දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂයන් හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව ශේෂයන් නිවැරදිව සඳහන් කර සසඳා නොතිබුණි. | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් සමග දෙපාර්තමේන්තු පොත් සැසඳීම් කර අත්තිකාරම් බී ගිණුම සකස් කර ඇති බැවින් අඩුපාඩු ඇත්නම් හඳුනාගැනීමේ හැකියාව ඇති බව. | දෙපාර්තමේන්තු පොත් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සමඟ සැසඳීම් නිවැරදිව සඳහන් කළ යුතු වේ. |

**1.6.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි හා පාඩු පිළිබඳ ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. | ගිණුම් අංශයට මෙම අනතුරු වාර්තා වී නොමැති අතර වාර්තා කළ පසු හානි පාඩු ලේඛණයේ ඇතුලත් කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාරව හානි හා අලාභ පිළිබඳ ලේඛනයේ රථවාහන අනතුරු 8 ක් සම්බන්ධයෙන් තොරතුරු ඇතුලත් කර යාවත්කාලීන කළ යුතු වේ. |

### 1.6.6 විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 ජුලි මාසයේ දී මූලධන වියදම්වලින් හරස් සටහන් මඟින් ඉවත් කරන ලද රු.100,325 ක් සඳහා ජ'නල් වවුචර් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | රු. 100,325.00 සඳහා ජ'නල් වවුචර් පිළියෙල කර ඇති බව. | ජ'නල් වවුචර් විගණනයට ඉදිරිපත් කළ යුතු වේ. |
| (ආ) | අංක 290-1-1-0-2104 දරන ගොඩනැගිලි හා ඉදිකිරීම් වැය විෂයයට අදාලව පවත්වාගෙන යන වැය ලෙජර් ගිණුම පරීක්ෂාවේ දී 2020 දෙසැම්බර් 31 දිනට ජ'නල් සටහන් අංක 565 මඟින් රු.303,490 ක වියදමක් ගැලපීම් කර තිබීම සහ අංක 189 දරන ජර්නල් සටහන මඟින් එම වියදම ඉවත් කිරීම සිදුකර ඇති බව ලෙජරයට අනුව නිරීක්ෂණය වූවද ඊට අදාල ජ'නල් සටහන් හා විස්තර විගණනයට ඉදිරිපත් නොවීය. | CIGAS වැඩසටහන යටතේ වැරදීමකින් වැය ශිර්ෂයක අධිභාරයක් ලෙස සටහන් වූ ලැබීම් වවුචර් 20/12/189 නිවැරදි කිරීම සඳහා ජ'නල් පත්‍රයක් ඉදිරිපත් කර ඇති බව. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනයේ 2020 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් ප්‍රකාශයට (**ACA-1(i)**) අනුව 2018, 2019 හා 2020 වර්ෂ සඳහා හිඟ ආදායම් පිළිවෙළින් රු.160,000 ක්**,** රු.75,000 ක් හා රු.4,202,199ක් වශයෙන් මුළු එකතුව රු.4,437,199ක් වී තිබුණි. හිඟ ආදායම්වලින් 2019 වර්ෂයේ රු.5,000ක මුදලක් පමණක් සමාලෝචිත වර්ෂයේදී අයකරගෙන තිබුණු බැවින් හිඟ ආදායම් අයකර ගැනීම දුර්වල මට්ටමක පැවතුණි. | කොවිඩ් වසංගතය හේතුවෙන් හිඟ ආදායම් රැස්කිරීමේ කටයුතු අඩපණ වූ අතර එම හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරන බව. | ඉකුත් වර්ෂයේ දී හිඟ ආදායම් අයකරගැනීම ද ඉතා දුර්වලව පැවතී බැවින් සැලසුම් සකස් කර ගෙන හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඉකුත් වර්ෂයේ රු. මිලියන 58.34 ක සත්‍ය ආදායමක් රැස්කරගෙන තිබියදී කළමනාකරණය විසින් සමාලෝචිත වර්ෂය සඳහා රු. මිලියන 48ක් ලෙස අඩුවෙන් ඇස්තමේන්තු කර තිබුණි. තවද ඉකුත් වර්ෂයේ රැස්කරගෙන තිබුණු බදු ආදායම හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සත්‍ය ලෙස රැස්කරගෙන තිබුණු ආදායම රු.43,562,801ක් වූ අතර ඒ අනුව සත්‍ය ආදායම සියයට 25.33කින් පහත වැටී තිබුණි. | කොවිඩ් වසංගතය හේතුවෙන් මත්ස්‍ය නිෂ්පාදනය, ආනයන අපනයන අඩුවීම, වරාය සේවා සැපයීම අඩුවීම, ස්වස්ථතා සහතික නිකුත් කිරීම අඩුවීම හා අනෙකුත් සේවාවන්ද පෙර පරිදි පවත්වාගෙන යාම අපහසුවීම නිසා ආදායම අඩුවෙන් ඇස්තමේන්තු කර ඇති බව. | තාත්විකව ආදායම් ඇස්තමේන්තු සකස් කළ යුතු අතර ඉලක්ක ලඟා කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | ඉකුත් වර්ෂයේ නියමු බලපත්‍ර නිකුත් කිරීමේ ආදායම රු.415,000ක් වුවද සමාලෝචිත වර්ෂය වෙනුවෙන් නියමු බලපත්‍ර ආදායම රු. 165,200ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ නියමු බලපත්‍ර සඳහා සත්‍ය ආදායම රු.312,350ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයේ ආදායම සැලකිල්ලට ගෙන ඇස්තමේන්තු කර නොතිබුණි. | අවිනිශ්චිත ආදායමක් වූ නියමු බලපත්‍ර ආදායම කොවිඩ් තත්වය හේතුවෙන් අඩුවෙන් ඇස්තමේන්තු කර ඇති බවත් සත්‍ය ආදායම රු.312,350ක් බවත් කොවිඩ් වසංගතය වැනි කාලවලදී අවිනිශ්චිත ආදායම් ඇස්තමේන්තු කිරීම අපහසු කාර්යයක් බව. | තාත්විකව ආදායම් ඇස්තමේන්තු සකස් කළ යුතු වේ. |

### 2.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳව ප්‍රගති සමාලෝචනයක් සිදුකර අදාල වාර්තා ලබාදීමට කටයුතු කරන බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 103(1)(ඇ) සහ 104(1), 104(2), 104(3), 104(4) | අනතුරු 8 ක් සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා වගකිව යුත්තන් තීරණය කර නොතිබුණි. | කොවිඩ් තත්වය හමුවේ මේ සම්බන්ධයෙන් පරීක්ෂණ සිදු කිරීමට නොහැකි විය. එම අනතුරු හා අලාභ හානි සම්බන්ධයෙන් ඉදිරියේදී පරීක්ෂණ සිදුකර අවශ්‍ය වාර්තා හා ලේඛණ ලබාගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 9.3 (ආ) වගන්තියට වූ 2010 සැප්තැම්බර් 8 දිනැති අංක 19 දරන අතිරේකය | රු.200,000 ක් ඉක්මවන වාහන අලුත්වැඩියාවන් සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු බව දැක්වෙතත් එකී නීතියට අනුව කටයුතු නොකර අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත පමණක් අලුත්වැඩියා කටයුතු සිදුකර තිබුණු අවස්ථා දෙකක් විය. | වාහන අනතුරු සම්බන්ධයෙන් කටයුතු සිදු කිරීමේදී වෙළඳපොළ මිළ සැදැහුම් ක්‍රමය යටතේ මිළ ගණන් කැඳවා අළුත්වැඩියා කටයුතු සිදුකර ඇති බැවින් එම කාර්යය නිවැරදිව සිදුකර ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.1 ඡේදය යටතේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1 | දෙපාර්තමේන්තුවට අදාල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී එහි ඇතුළත් සංඛ්‍යානමය අගයන් 2020 වර්ෂය සඳහා වූ භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශනයේ සඳහන් ආදායම්, වියදම් හා ප්‍රධාන ලෙජර් ශේෂ සමඟ සැසඳී තිබිය යුතු වේ. ඒවා අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන ඇමුණුම ලෙස මූල්‍ය ප්‍රකාශනයේ ඇතුලත් කළ යුතු වුවත් එබඳු ඇමුණුමක් ඉදිරිපත් කර නොතිබුණි. | ACA – 01 සිට ACA -06 දක්වා ඇමුණුම් ආදායම් වියදම් හා ප්‍රධාන ලෙජර් ශේෂ සමඟ සැසඳුම් කරන ලද වාර්තාවන් බව. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | 2020 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කර ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර ඉදිරිපත් කළ යුතු වේ. |

**3.2 පාඩු හා හානි**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ ජල ගැලීම් නිසා අලාභය ලෙස රු.16,244,568 ක් දක්වා තිබුණ ද අමාත්‍යාංශ ලේකම් ඇමතූ 2019 සැප්තැම්බර් 20 දිනැති අංක **DFAR/E**01/09/2018/41 දරන අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව ඇස්තමේන්තුගත අලාභය රු.18,977,960 ක් බව දක්වා තිබුණි. ඒ අනුව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මඟින් රු.2,733,392 ක අලාභය පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ අඩුවෙන් දක්වා තිබුණි. | හානි හා පාඩු පිළිබඳව නැවත පරීක්ෂා කර බලා හානි පාඩු ලේඛණය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | පාඩු හා හානි ලේඛනය යාවත්කාලීන කර නිවැරදිව පවත්වාගෙන යා යුතු වේ. |

## 3.3 කළමනාකරණ දූර්වලතා

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේ මෙහෙයුම් කටයුතු සඳහා ලියාපදිංචි බහුදින ධීවර යාත්‍රා ප්‍රමාණය 988ක් වූ අතර එම යාත්‍රා ලියාපදිංචි කිරීමේදී මීටර 13.5 සිට මීටර 15 දක්වා වූ යාත්‍රා සඳහා රු.5,000ක් ද, මීටර 15 සිට මීටර 24 දක්වා වූ යාත්‍රා සඳහා රු.50,000ක් ද මීටර 24ට වැඩි යාත්‍රා සඳහා රු.500,000ක් ද වශයෙන් ගාස්තු අයකරනු ලබයි. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා බහුදින ධීවර යාත්‍රා ලියාපදිංචි ආදායම රු.25,505,000ක් විය යුතු වුවද මුදල් අංශයේ ලේඛන අනුව එම ආදායම ලෙස රු.23,013,941ක් පමණක් පෙන්නුම් කර තිබුණි. ඒ අනුව නිරීක්ෂණය වී තිබුණු රු.2,491,059ක වෙනස සම්බන්ධයෙන් කළමණාකරණයේ අවධානය යොමු වී නොතිබුණි. | ධීවර යාත්‍රා මෙහෙයුම් කටයුතු සඳහා බලපත්‍ර නිකුත් කරනුයේ සාමාන්‍යයෙන් නොවැම්බර් 01 සිට ජනවාරි 31 දක්වා කාලය තුල බවත් ඒ අනුව 2020 වර්ෂය වෙනුවෙන් 2019 වර්ෂයේදී නිකුත් කළ බලපත්‍රවල වටිනාකම 2020 වර්ෂයේ ආදායමට එකතු නොවීම මෙම වෙනසට හේතුවී ඇති බව. | නිරීක්ෂණය වී තිබුණු රු.2,491,059ක වෙනස පැහැදිලිව හඳුනා ගත හැකිවන පරිදි ලේඛනගත කළ යුතු වේ. |
| (ආ) | මීටර 13.5 ට වැඩි බහුදින ධීවර යාත්‍රා 17ක් මෙහෙයුම් කටයුතු සඳහා බලපත්‍ර ලබාගෙන නොතිබුණ අතර එයින් එක යාත්‍රාවක් වර්ෂ කිහිපයක් සඳහා මෙහෙයුම් බලපත්‍ර ලබාගෙන නොතිබුණ ද ඒ සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ගයන් විගණනයට නිරීක්ෂණය නොවීය. එසේම මෙහෙයුම් බලපත්‍ර ලබාගෙන නොතිබුණු බහුදින ධීවර යාත්‍රා ධීවර මෙහෙයුම් කටයුතුවල යෙදෙන්නේ ද, මෙහෙයුම් බලපත්‍ර ලබා නොගැනීමට හේතු මොනවා ද යන්න පිළිබඳව දිස්ත්‍රික් ධීවර කාර්යාල හරහා පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් ද නොවීය. | ධීවර මෙහෙයුම්වල යෙදෙන සියළුම යාත්‍රා පළමුව ලියාපදිංචි වී තිබිය යුතුයි. ලියාපදිංචි වූ යාත්‍රා පමණක් දේශීය මුහුදේ හා ජාත්‍යන්තර මුහුදේ මෙහෙයුම් කටයුතු සඳහා ඉල්ලුම් කරනු ලබන බව. | මෙහෙයුම් කටයුතුවල යෙදෙන බහුදින ධීවර යාත්‍රා මෙහෙයුම් බලපත්‍ර ලබාගෙන ඇද්ද හා බලපත්‍ර ලබා නොගැනීමට හේතු හඳුනා ගැනීම සඳහා දිස්ත්‍රික් ධීවර කාර්යාල හරහා පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු වේ. |